**ශීර්ෂය 198 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යාවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර අදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 198 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිතුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 31 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණ වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතුවීම.<br><br>(අමාත්‍යාංශයේ කටයුතු සිදුකළ යුත්තේ හුදෙක් මූල්‍ය හා අමාත්‍යාංශ නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූලව බව) | 1. පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | 2.7 |
| | | 2. ප්‍රතිපාදන නොමැතිව අත්තිකාරම් ගෙවීම | 2.2.2 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.10 |
| | | 4. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු. | 2.11 |
| 127 (1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතුකිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතු වීම. | 1. විසඳා නොතිබුණු විගණන ඡේද. | 2.6 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.12 |
| 127 (2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අලුතින් හෝ | 1. ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන්. | 2.1 |

| | | | | |
|---|---|---|---|---|
| | වැඩියෙන් වියදම් කිරීම් සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 2. | විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම. | 2.2.1 |
| | | 3. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු. | 2.3 |
| 127 (3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකිවන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම. | 2.4 (අ) |
| | | 2. | පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම. | 2.4 (ආ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජණ ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත් එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ෂණයට භාජනය කිරීම. | 1. | වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම් වලට එළඹීම. | 2.5 (අ) |
| | | 2. | අයවැය ප්‍රතිපාදන රහිතව බැදීම්වලට එළඹීම. | 2.5 (ආ) |
| | | 3. | බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු. | 2.9 |
| 127 (6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම් පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතුකිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයට භාජනය කිරීම. | | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සදහන් අඩුපාඩු. | 2.8 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි අරමුණින් බැහැර වූ ක්‍රියාකාරකම්**

රාජ්‍ය ආයතන සඳහා වින රජයෙන් පෙරසවි ගොඩනැගිලි ආනයනය කිරීමට 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.මිලියන 13,003.3 ක් වැය කර තිබුණු අතර එම පෙරසවි ගොඩනැගිලි සවි කර භාරදුන් බවට තොරතුරු 2018 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශ ආධාර ව්‍යාපෘති**

---

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් සඳහා එකතුව රු. මිලියන 300 ක ප්‍රතිපාදන ද විදේශ ආධාර ව්‍යාපෘති 04 ක් සඳහා එකතුව රු.මිලියන 6,545 ක ප්‍රතිපාදන ද සලසා තිබුණු අතර ඉන් පිළිවෙලින් රු.මිලියන 147 ක් හා රු. මිලියන 2,678 ක් වශයෙන් රු. මිලියන 2,825 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 4,020 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදයෙන් සියයට 58.73ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. තවද එක් ව්‍යාපෘතියක රු.මිලියන 502 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 91 ක් වැය කර තිබුණි.

**2.2.1 විදේශ ආධාර ව්‍යාපෘති**

---

**දේශගුණික අවබලපෑම් අවමකිරීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තෝරාගත් ජලද්‍රෝණි 10 කට ආයෝජන සැලසුම් සකස් කිරීමට අපේක්ෂා කළ ද ජල ද්‍රෝණි 04 ක් සඳහා පමණක් සැලසුම් සකස් කර තිබුණි.

(ii) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් ක්‍රියාත්මක කළ පාසල් 18 ක නායයාම් තර්ජන අවම කිරීමේ ව්‍යාපෘතිවලට අදාළ කොන්ත්‍රාත් 12 කින් 10 ක් ආරම්භ කර තිබුණි. ඉන් 05 ක් අවසන් කර තිබුණු අතර 05 ක ප්‍රගතිය සියයට 06 සිට සියයට 45 දක්වා පරාසයක විය.

(iii) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගංවතුර හා නායයාම් නිසා සිදුවිය හැකි අපහසුතා මගහැරීම සඳහා තර්ජනයට ලක්වූ පාලම් සහ බෝක්කු වැඩි දියුණු කිරීම සහ තර්ජනයට ලක් වූ බෑවුම් වැඩිදියුණු කිරීමට පිළිවෙලින් හඳුනාගත් පැකේජ 10 ක් හා පැකේජ 07 කට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. ඉන් කොළඹ - වැල්ලවාය, මඩකලපුව - ත්‍රිකුණාමලය සහ පේරාදෙනිය - බදුල්ල යන මාර්ගවල කොන්ත්‍රාත්වල ප්‍රගතිය සියයට 27 සිට සියයට 59 දක්වා පරාසයක පැවතුණි.

**2.2.2 දේශීය අරමුදල් යෙද වූ ව්‍යාපෘති**

---

**ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශීය සමාගමකට ගිං නිල්වලා ගංඟා හැරවීමේ ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ දී ප්‍රතිපාදන නොමැතිව රු.මිලියන 3,008 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. එම අධිවැය පාර්ලිමේන්තුව විසින් 2018 ජූලි 30 වන විටත් අනුමත කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය හඳුනාගැනීම, කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම, අත්තිකාරම් ලබා දීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම යන කරුනුවලදී මනා ලෙස සැලසුම් සැකසීම, විනිවිද

භාවය ආරක්ෂා කිරීම, රෙගුලාසිවලට අනුගත වීම ආදිය සම්බන්ධයෙන් අදාල වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමුවී ඇති බවක් නිරීක්ෂණය නොවිය.

(ඇ) මෙම ව්‍යාපෘතිය සඳහා රජය වැය කර තිබුණු මුදලට සාපේක්ෂව සැලකිය යුතු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණු අතර රජයේ සම්පත් අනාර්ථික ලෙස උපයෝජනයට ලක්වී ඇති බවත් නිරීක්ෂණය විය.

(ඈ) අත්තිකාරම් ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බව තහවුරු වී තිබියදීත් අත්තිකාරම් ගෙවීම් සඳහා අරමුදල් නිදහස් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් නිරීක්ෂණය නොවිය.

(ඉ) එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවූ අතර 2018 වර්ෂය වන විටත් ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

**2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

**ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහනුවර ධර්මරාජ විදුහලේ නාය යෑමේ අවධානමක් සහිත භූමියක යකඩ දැල් අතුරා මිලි මීටර් 100 ක ඝනකමට කොන්ක්‍රීට් ආස්තරණය කර තිබුණ ද එම කොටසේ මානා පඳුරු වැවී තිබුණි. ඒ අනුව කොන්ක්‍රීට් ආස්තරණය නියමිත ප්‍රමිතියෙන් යුතුව නිමකර ඇති බවට නිරීක්ෂණය නොවීය.

(ආ) මහනුවර ආනන්ද විදුහල අසල ඉදිකර තිබුණු කළුගල් බැම්මට පහළින් වතුර බැස යාමට ඉදිකෙරෙන කානුවේ වැඩ 2017 අගෝස්තු 15 දින වන විට නිම කළ යුතු වුවත් 2018 නොවැම්බර් 21 දින වන විටත් අවසන් කර නොතිබුණි. නිමකර ඇති ඉදිකිරීම් ද නියමිත ප්‍රමිතියට අනුව සිදුකර ඇති බව නිරීක්ෂණය නොවුණි.

(ඇ) මහනුවර මහියංගනය මාර්ගයේ ස්ථාන කිහිපයකින් විශාල කළුගල් මහාමාර්ගයට පතිත වීමේ අවදානමක් තිබුණ ද එය දේශගුණික අවබලපෑම් හඳුනාගැනීමේ ව්‍යාපෘතිය මගින් හඳුනාගෙන නොතිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජුනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් වාරිමාර්ග කළමනාකරණ අංශයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2018 ජුනි 30 දින වන විටත් විගණකාධිපති වෙත

ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2016 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

**----------------------------------------------------------**

මහවැලි අධිකාරියට අයත් ගොඩනැගිළිවල කොත්මලේ වාරිමාර්ග සහ ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය පවත්වාගෙන යන අතර එහි සමාලෝචිත වර්ෂය තුළදී රු.7,029,124 ක් වැය කර ගොඩනැගිළි ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු සිදු කර තිබුණ ද ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.5 බැදීම් හා බැරකම්**

**------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

**(අ) වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම.**

**-----------------------------------------------------**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූලනොවී වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු.48,452,925 ක් වූ ප්‍රතිපාදනය රු.752,715 කින් ඉක්මවා රු.1,128,137 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**(ආ) ප්‍රතිපාදන නොමැතිව බැරකම්වලට එළඹීම.**

**---------------------------------------------**

මුදල් රෙගුලාසි 94 ට පටහැනිව ප්‍රතිපාදන නොමැතිව වැය විෂයයන් 11 ක් සඳහා රු.2,760,489 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**2.6 විසඳා නොතිබුණු විගණන ඡේද**

**---------------------------------**

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පසුවිපරම් කටයුතු නිම නොවූ ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2012 | 1.3(ඉ) | අයවීම් හිඟ හිටි සේවක ණය. |
| 2013 | 1.3(උ) | |

| | | |
|---|---|---|
| 2014 | 3.6 | |
| 2012 | 1.5(අ) | |
| 2013 | 1.5(අ) | |
| 2014 | 3.8(අ) | මඩාටුගම යාන්ත්‍රික වැඩපලේ ගාල් කර තිබෙන අලුත්වැඩියා නොකළ වාහන. |
| 2012 | 1.5(ඇ) | |
| 2013 | 1.5(ඇ) | |
| 2014 | 3.8(ඇ) | විධිමත් පරිදි අයිතිය පවරා නැති ජල බව්සර් සහ විදුලි උත්පාදක යන්ත්‍ර. |
| 2012 | 1.7(අ) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව දිරි ගැන්වීමේ දීමනා ගෙවීම. |
| 2016 | 3.10(ආ) | ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමට බැර කර වියදම් දරා තිබීම. |
| 2016 | 3.11 | උසස් නිලධාරින් දෙදෙනෙකු කූඨ ලේඛන උපයෝගී කර ගනිමින් සංයුක්ත දීමනා සහ අනියම් දීමනා ලබා ගැනීම. |

**2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය, ඉතිරිය සහ ඉක්මවීම පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය/ ඉක්මවීම්** | **ඉතිරිය/ ඉක්මවීම ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 2,165.17 | 2,061.69 | 103.48 | 4.78 |
| | මූලධන | 31,019.35 | 21,330.98 | 9,688.37 | 31.23 |
| | **එකතුව** | **33,184.52** | **23,392.67** | **9,791.85** | **29.51** |
| 2014 | පුනරාවර්තන | 2,308.70 | 2,279.95 | 28.75 | 1.24 |
| | මූලධන | 34,948.44 | 29,815.11 | 5,133.33 | 14.69 |
| | **එකතුව** | **37,257.14** | **32,095.06** | **5,162.08** | **13.85** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2015 | පුනරාවර්තන | 333.29 | 315.45 | 17.84 | 5.35 |
| | මූලධන | 6,881.77 | 8,824.48 | (1,942.71) | (28.23) |
| | **එකතුව** | **7,215.06** | **9,139.93** | **(1,924.87)** | **(26.68)** |
| 2016 | පුනරාවර්තන | 434.59 | 408.37 | 26.22 | 6.03 |
| | මූලධන | 13,268.62 | 5,184.62 | 8,084.00 | 60.93 |
| | **එකතුව** | **13,703.21** | **5,592.99** | **8,110.22** | **59.18** |
| 2017 | පුනරාවර්තන | 534.89 | 524.25 | 10.64 | 1.99 |
| | මූලධන | 9,672.43 | 5,324.68 | 4,347.75 | 44.95 |
| | **එකතුව** | **10,207.32** | **5,848.93** | **4,358.39** | **42.70** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයන් 05 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 2,502 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයන් 37 ක් සඳහා එකතුව රු. මිලියන 5,788 ක් අධි ප්‍රතිපාදන සලසා තිබීමෙන් එම වැය විෂයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 4,140 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 19801 දරන රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25.00 | 20.95 | 7.00 | 11.22 | 54.00 | 34.47 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අය කර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂය හැර රු.1,323,349 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අය කර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ආ) ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අය කර නොගැනීම**

මෙම අමාත්‍යාංශයේ සේවය කරමින් සිට වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන්ගෙන් එකතුව රු.614,763 ක් වූ ණය ශේෂ අදාල අමාත්‍යාංශයෙන්, දෙපාර්තමේන්තුවෙන් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන්, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මාසික ගිණුම් සාරාංශ මඟින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

**2.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ රු.299,149 ක චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | පරිඝණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ඈ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

## 2.11 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ කාර්යභාරය සමඟ සැසඳීමේ දී අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් නිළධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි.

(ආ) මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2016 ජුනි 10 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති මුළු පිරිවැය ඇ.ඩො.මිලියන 10 ක් හෝ ඊට වැඩි විදේශාධාර පාදක සංවර්ධන ව්‍යාපෘති සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතිය ඇතිව අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට අප්‍රමාදව ක්‍රියා කළයුතුය. එහෙත් ඊට අනුකූල නොවන ලෙස ව්‍යාපෘති පිරිවැය ඇ.ඩො.මිලියන 153.8 ක් වූ දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකයන්ගෙන් තෝරාගත් අභ්‍යන්තර විගණකවරු 05 දෙනෙකු ඇතුළත් අභ්‍යන්තර විගණන කමිටුවක් පිහිටුවා තිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 133 හි සඳහන් කාර්යභාරයන් අභ්‍යන්තර විගණන කමිටුව විසින් ඉටු කර නොතිබුණි.

## 2.12 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්යය මණ්ඩලය, තථ්‍ය කාර්යය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්යය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 235 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.583,126 ක් වි තිබුණි.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 89 | 29 | 60 | - |
| (ii) | තෘතියික මට්ටම | 47 | 27 | 20 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 228 | 204 | 33 | 09 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 144 | 143 | 24 | 23 |
| | එකතුව | 508 | 403 | 137 | 32 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

**(අ) අවශ්‍යතාවය ඉක්මවා කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීම.**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 137 ක් පැවතියද, 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජණ ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්යය මණ්ඩල පුරප්පාඩු පැවතිම ප්‍රධාන වශයෙන් බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්යය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් සිදු වී තිබුණු බව විගණනයේ දී නිරික්ෂණය විය.

**(ආ) අනුමත කාර්යය මණ්ඩලය බඳවා නොගැනීම**

(i) සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඒකක (PIU) 06 ක් වෙනුවෙන් තනතුරු 230 ක් සඳහා නිලධාරීන් 1,117 ක් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට තනතුරු 132 ක් සඳහා වූ නිලධාරින් 461 ක් දෙනෙකු බඳවාගෙන නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයක් වූ මාර්ග සංවර්ධන අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ කාර්යයන් ඉටු කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණු තනතුරු 21 න් තනතුරු 14 ක් සඳහා නිලධාරීන් 17 දෙනෙකු බඳවාගෙන නොතිබුණි.

**(ඇ) අනුමත බඳවාගැනීමේ ක්‍රමවේදයට අනුකුල නොවන පරිදි බඳවාගැනීම**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද බඳවා ගැනීමේ ක්‍රමවේදයට අනුකුල නොවන පරිදි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පරිසර ආරක්ෂණ විශේෂඥයෙකු සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් වන මාර්ග සංවර්ධන අධිකාරිය

විසින් ව්‍යාපෘති ඉංජිනේරුවරු 3 දෙනෙක් ද, තාක්ෂණික නිලධාරියෙකු ද, තාක්ෂණික සහායක නිලධාරියෙකු ද සහ රියදුරන් 4 දෙනෙක් ද බඳවාගෙන තිබුණි.

**(ඇ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

-----------------------------------------------------------

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ දී සහ ඉකුත් වර්ෂයේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවකයින් 06 දෙනෙකු ද ජල සම්පත් මණ්ඩලයේ එක් සේවකයෙකු ද අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදවාගෙන තිබුණි. තවද අමාත්‍යාංශයේ සේවයේ නියුතු 06 දෙනෙකු කොත්මලේ ජාත්‍යාන්තර පුහුණු ආයතනය, වාරිමාර්ග කළමනාකරණ අංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ දේශගුණික අවබලපෑම් අවමකිරීමේ ව්‍යාපෘතියට අනුයුක්ත කර තිබුණි.